www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලය

# ජෙෆ්රි ස්වේන් හා ඉයන් ඩී. තැචර් විසින් රචිත ට්‍රොට්ස්කි ජීවන චරිත ද්වය පිලිබඳ ව විවරණයක්

### සිවු වන කොටස: ට්‍රොට්ස්කිගේ අදාලත්වය

**Leon Trotsky and the post-Soviet school of historical falsificationA review of two Trotsky biographies by Geoffrey Swain and Ian Thatcher - Part 4**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2007 මැයි 12**

*මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සභාපති වූ ද සමාජවාදී සමානතා පක්ෂයේ (ඇමරිකා එක්සත් ජනපද) ජාතික ලේකම් වූ ද ඩේවිඩ් නෝර්ත් විසින් මහාචාර්ය ජෙෆ්රි ස්වේන් සහ මහාචාර්ය ඉයන් ඩී. තැචර් යන ශාස්ත්‍රාලිකයින් දෙදෙනා ලියූ ලියොන් ට්‍රොට්ස්කිගේ චරිතාපදාන දෙකක් ගැන කරන ලද කොටස් හතරකින් යුත් විවරණයක අවසාන කොටසයි.*

ට්‍රොට්ස්කි, ජෙෆ්රි ස්වේන් විසිනි. පිටු 248, ලෝන්ග්මන්, 2006.

ට්‍රොට්ස්කි, ඉයන් ඩී. තැචර් විසිනි. පිටු 288, රූට්ලෙජ්, 2003.

## විප්ලවය ඉටු කල නොහැක්කක් ය යන්න පිලිබඳව තැචර්

තමා ලියන ට්‍රොට්ස්කි චරිතාපදානයේ දී තැචර් අත නොහැර දිවෙන අන්තර් සම්බන්ධිත තර්ක දෙකක් යලි යලිත් ඉදිරිපත් කරයි: 1) ට්‍රොට්ස්කි විසින් ස්ටැලින් පරාජය කරනු ලැබී නම් වුව රුසියානු යුරෝපීය ඉතිහාසය වෙනත් ආකාරයකට වර්ධනය වේ යයි සිතීමට හේතුවක් නැත. 2) ස්ටැලින් පිලිබඳව ට්‍රොට්ස්කි කරන විවේචන සමස්තයක් වසයෙන් ගත් කල්හි අසාධාරනය. ආර්ථික පිලිවෙත සලකා බලමින් තැචර් මෙසේ ප්‍රකාශ කරයි, "සත්තකින්ම කිසියම් ආශ්වර්යයකින් ට්‍රොට්ස්කි අතට බලයේ රැහැන්පට හසු වී නම්, ඔහුගේ ක්‍රියාමාර්ගයෙන් පොරොන්දු වූ ප්‍රතිපත්තිමය සාර්ථකත්වයක් දිනා ගැනීමට ඔහු සමත් වනු ඇද්දැයි සැක කිරීමට බොහෝ හේතු පවතී. උදාහරනයක් හැටියට ට්‍රොට්ස්කි විසින් මෙහෙයවුනු සෝවියට් ආර්ථිකයක් ආර්ථික ප්‍රසාරනය ද දියුනු ජීවන තත්වයන් ද සම්පාදනය කිරීමට සමත් වීමට ඉඩ තිබුනි දැයි ප්‍රශ්න කල හැකි ය."[84] ඔව්, කාට වුව ඕනෑ ම දෙයක් "ප්‍රශ්නයට භාජන කිරීම" කල නොහැක්කක් නොවේ. එහෙත් ප්‍රයුක්තිය වන්නේ, සහතිකව හා නිශ්වයව ම වාම විපක්ෂයේ ක්‍රියාමාර්ගය සාර්ථක වෙයි ද යන්න නීර්නය කිරීම නොවේ. සහතික නිශ්චිතතාව අත් පත් කර ගත නොහැකිය; නම් ප්‍රයුක්තිය මෙහිලා අදාල වාම විපාර්ශ්වය ස්ටැලින්වාදී නායකත්වයට වඩා සෝවියට් ආර්ථිකයේ ගැටලු පිලිබඳ ව වැඩි වැටහීමක් දරා සිටියේ ද යන්නය; ගැටලු අපේක්ෂා කිරීමේ දී ද ව්‍යසනයක කඩා පාත් වීමට පෙරාතුව සමනකාරී පියවර යෝජනා කිරීමේ දී ද වාම විපාර්ශ්වය ඉමහත් වැඩි වැටහීමක් දක්වූයේ ද යන්නයි. මෙම ප්‍රශ්න දෙකට ම අපට කිසිදු දෙගිඩියාවකින් තොරව 'ඔව්' යයි පිලිතුර දිය හැකි ය. මෙම පදනමේ පිහිටා අපට ඇසිය හැකි ප්‍රශ්නය එනම් - අතලඟ එන අන්තරායට වඩාත් කල් ඇතිව දක්වුනු ප්‍රතිචාරයක් මගින් ද ඒ අන්තරායන්ගේ නරකම විපාක මග හැර ගැනීම මගින් ද - සෝවියට් ආර්ථිකය මිනිස් බිලි අවම කොට වඩා ඉහල සාර්ථකත්වයක් අත් කර ගැනීමට ඉඩකඩ තිබුනි ද'යි විමසුවොත් එයට ද පිලිතුර වන්නේ 'ඔව්' ය යන්නයි. තැචර් කිසි ලෙසකත් ප්‍රයුක්තීන් මේ ආකාරයට ගවේෂනය කරන්නේ නැත; 1927 දී වාම විපාර්ශ්වය විසින් නිෂ්පාදනය කරනු ලැබූ සවිස්තර වැඩ පිලිවෙල ගැන කුමන සඳහන් කිරීමක් හෝ කරන්නේ ද නැත. ඒ වෙනුවට ඔහු ඉදිරිපත් කරන්නේ ස්ටැලින්ට සහ ස්ටැලින්වාදයට ඓතිහාසික ක්ෂමාලාපයක් බවට අනුවර්තනය වන දෛවවාදයේ සුවිශේෂ රූපයකි. තැචර් ජාත්‍යන්තර විප්ලවවාදී පිලිවෙතේ සෑම වැදගත් ප්‍රයුක්තියකට ම දක්වන්නේ මෙම ප්‍රවිෂ්ටය ම යි.

ස්ටාලින් විසින් චියාං කායි-ෂෙක්ගේ කුවෝමින්ටානයට චීන කොමියුනිස්ට් පක්ෂය යටත් කිරීම වැදගත් සාධකයක් ලෙස ක්‍රියාකාරී වෙමින් 1927 දී චීන විප්ලවයට අත් කරදුන් විනාශකාරී පරාජය දෙසට හැරෙමින්, තැචර් තහවුරු කරන්නේ "1926 දී චීන කොමියුනිස්ට් පක්ෂය කුවොමින්ටානය අත හැරියේ " නම් වුව ද එම පක්ෂයට 1927 දී ලත් දෙයට වැඩි සාර්ථකත්වයක් ලබාගැනීමට ඉඩ තිබුනු බව

ඔප්පුකිරීමට සාක්ෂ්‍ය ඇත්තේ නැත”[85]යි කියා ය. තැචර් තක්සේරු කර ඇත්තේ කුමන ‘සාක්ෂ්‍ය ද?’ 1925-27 සිද්ධීන් පිලිබඳව ඔහු පර්යේෂන කර තිබෙන්නේ කොතැන ද? 1925-27 ස්ටැලින්ගේ පිලිවෙත්වල ව්‍යසනකාරී විපාකයන් විශ්ලේෂනය කරමින් ලියන ලද දේශපාලන හා ඓතිහාසික සාහිත්‍යය විශාල ප්‍රමානයක් පවතී; ඉන් සැලකියයුතු කොටසක් නිෂ්පාදනය කරන ලද්දේ චීන විප්ලවවාදීන් විසිනි. තැචර් මෙම සාහිත්‍යය පිලිබඳව යන්තමින් හෝ දැනුවත් යයි සිතීමට ඇති සාක්ෂ්‍යයක් ද නැත. 1927 අප්‍රේල් මස චියාංං-කායි-ෂෙක්ට ෂැංහයි කම්කරුවන් ඝාතනය කිරීම ලෙහෙසි කරන ලද්දේ එම ප්‍රහාරය කල්තබා වැලැක්වීමට හෝ අඩු වසයෙන් චීන කම්කරුවන්ට ආපසු හැරී සටන් කිරීමට හෝ හැකි වන පරිද්දෙන් අවශ්‍ය ආරක්ෂක පියවරයන් ගැනීමට චීන කොමියුනිස්ට් පක්ෂය අසමත් වීම නිසා ය යන්න ඓතිහාසික සත්‍ය කරුනකි. චීන කොමියුනිස්ට් පක්ෂයේ අකර්මන්‍යතාව තීන්දු කරනු ලැබුවේ චියාංං-කායිෂෙක් ද ධනේශ්වර කුවෝමින්ටානය ද තරහ කරගත යුතු නැතැයි ස්ටැලින් චීන කොමියුනිස්ට් පක්ෂයට කල ඇනැවීම විසිනි. අවුරුද්දක් තරම් කාලයක්, ට්‍රොට්ස්කි ද වාම විපාර්ශ්වය ද එවන් පිලිවෙතකින් පැන නගින ආත්ම-මාරක අන්තරාය පිලිබඳව අනතුරු හැඟැවී ය. ඔවුන්ගේ අනතුරු ඇඟවීම් කල් තබා ගනනට ගෙන ක්‍රියාක්මක වී නම් වුවද ඉන් වෙනසක් සිදුවනු නැතැයි කියා පෑම වනාහී අඩු වසයෙන් සමාජවාදී විප්ලවය පිලිබඳව හෝ වෙනස් කල නොහැකි ඓතිහාසික කොන්දේසියක් බවට අසරන භාවය ඉහල දැමීමකි.

ජර්මනිය පිලිබඳ ප්‍රශ්නයේ දී ද තැචර් තර්ක කරන්නේ ඔය ආකාරයට ම ය:

> “කේපීඩීයේ (ජර්මනියේ කොමියුනිස්ට් පක්ෂයේ) ප්‍රමාදයන් ද ජර්මන් කොමියුනිස්ට්වාදීන් වෙනත් මගක් ගත්තාහු නම් හිට්ලර්ගේ ජයග්‍රහනය වලක්වා ගත හැකිව තිබුනේ ය යන හැකියාව ද පිලිබඳ ට්‍රොට්ස්කිගේ විස්තරයට එක්තරා ආකර්ෂනයක් පවතී. පසුව කරන ලද අධ්‍යයනයන්ගෙන් ද එවන් ආස්ථානයකට ලැබෙන සහය පුදුමයට කරුනක් නොවේ. ජාතික සමාජවාදී ජර්මන් කම්කරුවන්ගේ පක්ෂය (නාසි පක්ෂය) කවර කලෙකවත් බලයට පත්වූයේ නැතිනම් කොතරම් අගේදැයි ප්‍රාර්ථනා නොකරන්නේ කව්ද? එසේ වුවත් කෙනෙකුට නැගිය හැකි ප්‍රශ්නය නම් සිද්ධීන් මත මීට වඩා බලපෑමක් කිරීමට ට්‍රොට්ස්කි සමත් වී නම් ඉතිහාසය එතරම් වෙනසකට භාජන වේ ද යන්න ය... ට්‍රොට්ස්කි කම්කරුවන්ගේ බලය අධිතක්සේරු කලේ ය; නාසීන්ගේ බලය අවතක්සේරු කලේ ය කොමියුනිස්ට්වාදීන් සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ හවුලක්ම ද පරයා වුව හිට්ලර් බලයට පත් වීමට ඉඩ තිබුනි.ට්‍රොට්ස්කි ඉල්ලා සිටි ආකාර පිලිවෙත් වෙනසක් කේපීඩීය විසින් කරන ලද්දේ නම් වුව ද එය නාසි පක්ෂය විසින් ආන්ඩුවක් තැනීම වැලැක්වීමට නොසෑහෙනවා ඇත.”[85]

කම්කරු පන්තියේ ප්‍රධාන පක්ෂ දෙක වූ ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය (එස්පීඩී) සහ ජර්මන් කොමියුනිස්ට් පක්ෂය (කේපීඩී) විසින් හිට්ලර්ගේ ජයග්‍රහනයට මග පාදමින් ඉටු කල තීරක ක්‍රියා කලාපය බරපතල ඓතිහාසික මතභේදයකට භාජන වූ කරුනක් නො වේ. මෙම පක්ෂ තමන්ට ද සෙසු ජනතාවට ද මෙවන් ව්‍යසනයක් අත් පත් කර දුන් පිලිවෙත් අනුගමනය කලේ මන්ද යන්න පිලිබඳව නම්, ඇත්ත වසයෙන් බොහෝ ප්‍රශ්න පවතී. එහෙත් ඓතිහාසික නිශ්චිතතාවයට ලංවිය හැකි උපරිම ප්‍රමානයට තහවුරු වී ඇති කරුනක් නම් තමන් සමග දසලක්ෂ සංඛ්‍යාත සාමාජිකයන් සිටියේ වුව ද කම්කරු පන්ති පක්ෂ තමන් සම්පූර්න දේශපාලන අබලන් බවට පත් කරගත් පිලිවෙතක් අනුගමනය කල බවය. ජර්මනියේ ප්‍රධාන මහාජන පක්ෂ පක්ෂ දෙකේ ක්‍රියාකාරීත්වය කොහොම උනත් එරටේ දේශපාලන අරගලයේ ප්‍රතිඵලය කෙරේ බලපානු නැතැයි යන්න එනම් කුමක් සිදු වුවත් හිට්ලර් බලය අල්ලා ගැනීම නොවැලැක්විය හැකි වී ය යන නිගමනය, කම්කරු පන්ති ව්‍යාපාරය ද සමාජවාදී දේශපාලනය ද දේශපාලනික හා ඓතිහාසික වසයෙන් කිසිදු අදාලකමක් නැති දේ බවට පත් කිරීමකි. තැචර්ගේ තර්කයෙන් අනිවාර්යයෙන්ම ගලා එන නිගමනය නම් මෙයයි.[86]

ට්‍රොට්ස්කිගේ දේශපාලනය පිලිගනු ලැබුව ද, ඉන් කිසිදු වෙනසක් ඇතිවීමට ඉඩක් තිබුනේ නැතැයි තැචර් යලියලිත් කියාපාන නමුදු ඔහු දැඩිව ස්ටැලින් පිලිබඳව ට්‍රොට්ස්කි කල විවේචනවලට එරෙහිව තර්ක කරයි. ට්‍රොට්ස්කි කෙරේ තැචර් දක්වන්නා වූ විරුද්ධත්වයත්, ස්ටැලින් කෙරේ දක්වන්නා වූ පක්ෂපාතිත්වයත් කොතරම් දෘඩ දැයි කිවහොත් ඔහුගේ කෘතිය දුවවනු ලබන්නේ අප්‍රකාශිත දේශපාලන ඇජෙන්ඩාවක් (න්‍යාය පත්‍රයක්) විසින් යැයි නොසිතාම බැරි තරම් ය. දිගු කලකට පෙර ඊ.එච්. කාර් තම *What is History?* (ඉතිහාසය යනු කුමක්ද?) යන යුක්තිසහගත ව ම සුප්‍රසිද්ධ කෘතියේදී ඉතිහාසඥයාගේ ජටාව තුල ගුමන බිගු නදට පරෙස්සමින් ඇහුම්කන් දෙන ලෙස අපට අවවාද කලේ ය. යහපත් ඉතිහාසඥයාගේ ජටාවේ භෘංගයෝ ඒ සමග එන ද්‍රව්‍යමය කාරනා සමග සුන්දරව සමවාය වන්නා වූ මිහිරි හා සංඝටිත නාදයක් නිකුත් කෙරෙති. එහෙත් තැචර් මහතාගේ ජටා මන්ඩලයෙන් නිකුත්වන්නේ ගෝසාකාරී, අසංගත හා පක්ෂවාදී ගෝසාවකි. එය සමාන වන්නේ ස්ටැලින්වාදී දෙබර හඬට ය. මෙහි ලා මගේ උත්සුකය නම් තැචර්ගේ දේශපාලනය නොවේ, - ඔහු ගේ දේශපාලනයේ

පෞද්ගලික හිමිකම ඔහුට අයිතිය - මා අවධානය යොමු කරන්නේ ඔහු ඓතිහාසික කරුනුවලට සලකන ආකාරයට ය. භෘංගයන් (හෝ දෙබරුන්) බරපතල ගැටලුවක් වන්නේ උන්ගේ නාදය කොතරම් උච්ච දැයි කිවහොත් (සැබෑ) ඉතිහාසය නො ඇසීමයන තත්වයක් උද්ගතවන විට ය.

## තැවර් ස්ටැලින්ව ආරක්ෂා කරයි

ට්‍රොට්ස්කිගේ විවේචනයට එරෙහිව ස්ටැලින් ආරක්ෂා කරමින් තැවර් ප්‍රකාශ කරන්නේ "ලෝක විප්ලවය ස්ටැලින්වාදීන් විසින් පාවාදීම පිලිබඳ" ට්‍රොට්ස්කිගේ "ප්‍රවාදය ඒක-පාක්ෂික මෙන් ම විශ්වසනීයද නොවන" බව ය. ඔහුට අනුව "එය, උදාහරනයක් හැටියට කොමියුනිස්ට් පක්ෂවල ප්‍රසාරනය තුල පෙනීයන - මහජන-පෙරමුනු උපායේ සාධනීය අංග, නොතකා හරී."[87] මේ ස්ථානයේ දී, මහාචාර්ය තැවර් තම චරිතාපදාන රචනයේ සමාප්තියටට ලඟාවෙද්දී ඉතිහාස රචනය ද දේශපාලන ප්‍රවනතාත්මක විවාද ද අතර වෙනස මැකී යයි. චරිතාපදානයක් ලිවීම පිලිබඳ ව්‍යාජය මුලුමනින්ම පාහේ අතහැර දැමේ; ඒ වෙනුවට පාඨකයාට ගිල්ලවනු ලබන්නේ ස්ටැලින්වාදී පක්ෂ පිලිවෙතයයි කලෙක නම් කරනු ලැබූ දේ ම ය. මහජන පෙරමුනු සමයේ ස්ටැලින්වාදී "සාර්ථකත්වය" හුවා දක්වන තැවර් ස්ටැලින්වාදී "තුන්වන පරිච්ඡේදයේ" අති-වාමවාදයේ ව්‍යසනයන්ගේ ඉක්බිත්තේ - ධනේශ්වර පක්ෂයන් සමග සන්ධානයන් ගොඩනැගීමට ගන්නා ලද නැඹුරුව පිලිබඳ ව 1935 කොමින්ටර්න් සත්වන සම්මේලනයේ දී ට්‍රොට්ස්කි කල විශ්ලේෂනය නොතකා හරී. සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී විදෙස් පිලිවෙත් අවශ්‍යතාවන් තුල මුල් බැසගත් වර්ධනයක් වූ (කොමින්ටර්නයේ) සත්වන සම්මේලනය සහ එය විසින් මහජන පෙරමුනුවාදය වැලඳගැනීම කොමින්ටර්නය සහ සමාජවාදී විප්ලවයේ ඉදිරි දර්ශනය අතර සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කිරීමක් සලකුනු කලේය යන ට්‍රොට්ස්කිගේ තක්සේරුව පිලිබඳ ව තැවර් මොනම සැඳහුමක් හෝ කරන්නේ නැත. ඉහත තක්සේරුව ඊ.එච්. කාර් තම "කොමින්ටර්නයේ මලහිරු" (*The Twilight of the Comintern*) නම් කෘතියේ දී අනුමත කලේ ය.[88]

තැවර් තවදුරටත් මෙසේ ලියයි: "කොමින්ටර්නයේ උපාය මාර්ග සෝවියට් රාජ්‍යෝපායේ අවශ්‍යතාවන් මත රැඳී පැවැත්තේය යන ට්‍රොට්ස්කිගේ මතය තහවුරු කිරීමට සාක්ෂ්‍ය ඇත්තේ ද නැත."[89] මෙතැන්හිදී තැවර් තර්ක කරන්නේ ට්‍රොට්ස්කිට එරෙහිව නොවේ, ඓතිහාසික සාක්ෂ්‍යවල අතිමහත් වූ බරසාර බවට එරෙහිව ද වේ. එවන් අභ්‍යර්ථනයක් කරන්නා වූ කර්තෘ තෙමේ ඉතිහාසඥයෙකු ලෙස බරපතලව ගනන්ගනු ලැබීම සඳහා තමන්ට පවත්නා අයිතිය අහෝසි කර ගන්නේ ය. 1939 හිට්ලර් - ස්ටැලින් ගිවිසුම අත්සන් කල පසු ලෝකය පුරාම ස්ටැලින්වාදී පක්ෂයන්හි ප්‍රතිපත්තිවල එක් රැයින්ම ඇති වූ පරිවර්තනය තැවර් කෙසේ පැහැදිලි කරන්න ද? එසේම 1937-39 ස්ටැලින්වාදී භීෂනය විසින් ජාතික කොමියුනිස්ට් පක්ෂවල ප්‍රධාන සාමාජිකයන් විශාල සංඛ්‍යාවක් ශාරීරිකව ම විනාශ කර දැමීම පිලිබඳ කාරනය ද මෙහිලා මතුවන්නේ ම ය. යථාසමව පෝලන්ත කොමියුනිස්ට් පක්ෂයේ සමස්ත නායකත්වයම ට්‍රොට්ස්කිගේ ආනුභාවයට නැමෙන සුලුය යි ස්ටැලින් විසින් සලකනු ලැබීම හේතුකොට ගෙන සමූලෝත්පාටනය කෙරිනි. හිට්ලර්ගෙන් ගැලවීම සඳහා සෝවියට් සංගමයට පලාගොස් සිටි ජර්මානු කොමියුනිස්ට් පක්ෂයේ විශාල කොටස් භීෂනය සමයේ මොස්කව්හි දී ඝාතනයට ලක් වූහ. නාසීන් විසින් අල්ලා ගනු ලැබූ ජර්මන් කොමියුනිස්ට් පක්ෂ නායක අර්නස්ට් තේල්මාන් මුදා ගැනීමට අවස්ථාවක් ස්ටැලින් - හිට්ලර් ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ස්ටැලින්ට ලැබුනේ නමුත්, තේල්මාන්ව සෝවියට් භාරයට ගැනීමට ඉල්ලා සිටීම ප්‍රතික්ෂේප කල ස්ටැලින් තේල්මාන්ට හිට්ලර්ගේ වධක කඳවුරක මැරී යන්නට ඉඩ සැලැස්විය. 1945 දී නැගෙනහිර ජර්මන් රාජ්‍යය ලෙස මතු වූ දෙයෙහි පාලනය සියතට ගන්නට සෝවියට් සංගමය තුල පිටුවහලේ සිට ඉදිරිපත් වූ නායකත්වය වනාහී - තමන්ගේ ම කොමියුනිස්ට් පක්ෂ සහෝදරවරුන් පාවාදීම මගින් ස්ටැලින්ගේ අනුමැතිය දිනා පන බේරාගත්තවුන් ය. මේ සියල්ල ඇතුලත් වන්නේ කොමියුනිස්ට් පක්ෂයන් සෝවියට් පාලනතන්ත්‍රයේ අනාඥාවට යටත් කිරීමක් නොවේ නම් වෙන කුමක් ද?

කොමින්ටර්න් පිලිවෙත් කාවැදී පැතිර ගිය ආකාරය වටහා ගැනීමට ජීපීයූවේ (පසුව එන්කේවීඩී යන නම ලත් ස්ටැලින්ගේ රහස් පොලීසියේ) ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමක් අවශ්‍ය ය. තමාව මරා දැමීමට සති දෙකකට පෙර ට්‍රොට්ස්කි සමාප්ත කල, ඔහු අන්තිමට ලියූ ලිපිවලින් එකක් වූ, <u>කොමින්ටර්න් ඇන්ඩ් ද ජීපීයූ</u> (කොමින්ටර්නය සහ ජීපීයූව) [90] නම් කෘතියේදී මෙම ප්‍රශ්නය සවිස්තරව සාකච්ඡාවට බඳුන් කලේ ය. ජීපීයූවෙන් බිඳුනු වෝල්ටර් ක්‍රිවිට්ස්කි ද ඇමරිකානු කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයේ හිටපු - සාමාජික බෙන්ජමින් ජිට්ලෝ ද යන දෙදෙනා ගේ සාක්ෂ්‍ය ඉදිරිපත් කරමින් ට්‍රොට්ස්කි ස්ටැලින්වාදී සංවිධාන මත ජීපීයූ ඒජන්තයන් විසින් පවත්වා ගෙන යනු ලැබූ පාලනය ලේඛනගත කලේ ය. දේශීය ස්ටැලින්වාදී පක්ෂවල පිලිවෙත් මෙහෙයවමින් පාලනය කිරීමට මුදල් ධාරාව යොදාගනු ලැබූ සැටි පෙන්නුම් කිරීමට ට්‍රොට්ස්කි මූල්‍ය ගනුදෙනු පිලිබඳ විශ්ලේෂනයක් ද ඊට ඇතුලත් කලේ ය. මෙම පක්ෂ මොස්කව් මත මූල්‍ය වසයෙන් රැඳී පැවති ආකාරය ද ඔහු විදහා දැක්වී ය. තැවර් මෙම ලියවිල්ල පරීක්ෂාකර බලන්නේ හෝ විග්‍රහ කරන්නේ හෝ එයට පිලිතුරු

දෙන්නේ හෝ නැත. - එහෙත් එය වනාහී ට්‍රොට්ස්කි 1940 අගෝස්තු 21 තම මරනයට පෙර ලියූ අවසාන ප්‍රධාන ප්‍රකාශයයි. තැචර් නිකම්ම එය නොතකා සිටී.

තැචර් තවත් පෙරමුනක ස්ටැලින් පිලිබඳ ආවේගශීලී ආරක්ෂනයක් කරමින් මෙසේ ලියයි: " අවසානයේ දී ට්‍රොට්ස්කි පැහැදිලි ව ම සෝවියට් සංගමයට එරෙහි ජර්මානු යුද්ධ ප්‍රකාශයකට මුහුන දී නැගී සිටීමට සෝවියට් සංගමයට පැවති ධාරිතාව අඩු තක්සේරු කලේ ය. එහෙත් 1941 දී ජර්මානු ආක්‍රමනයක් සිදු වූ අතර, එම ආක්‍රමනය විසින් මුලදී ඇති කල ව්‍යාකූලත්වය මැද්දේ ද ස්ථිරසාරව නැගී සිටි ස්ටැලින් තමා දක්ෂ යුද නායකයකු බව ඔප්පු කලේ ය." [91] මෙහිලා ප්‍රයුක්තීන් දෙකක් මතු කෙරේ: යුද්ධයක් සිදුවීමේ තතු තුල සෝවියට් සංගමයේ ඔරොත්තු දීමේ ශක්තිය පිලිබඳ ට්‍රොට්ස්කි ගේ තක්සේරුව ඉන් පලමුවැන්න ය. දෙවැන්න නම්, යුද නායකයෙකු ලෙස ස්ටැලින්ගේ භූමිකාවයි. පලමුවැන්න සම්බන්ධයෙන් ගතහොත් තැචර් ට්‍රොට්ස්කිගේ ආස්ථානය යලිත් මුසාකරනය කරයි. ට්‍රොට්ස්කි විසින් යුද්ධයක තතු තුල ප්‍රතිරෝධය දැක්වීමට සෝවියට් සංගමයට පවත්නා ශක්තිය පිලිබඳව කරනු ලැබූ අතිශයින්ම පරිපූර්න ප්‍රකාශය තැචර් උපුටා දක්වන්නේ නැත. 1934 දී ට්‍රොට්ස්කි ලියූ ද රෙඩ් ආමි (රතු හමුදාව) නමැති කෘතියේදී ට්‍රොට්ස්කි තැචර් ඔහුට පවරා ඇති මතයට පරිපූර්න ව ම ප්‍රතිවිරුද්ධ නිගමනය කරා එලඹුනේ ය. "ඉතිහාසයේ ග්‍රන්ථ කියවා ගැනීමට දත් තැනැත්තේ 1905 පටන් අවුරුදු 30ක් තරම් තිස්සේ නගිමින් හා බසිමින් පැවතීගෙන ආ රුසියානු විප්ලවය තම මහෝසය යුද්ධයේ ඇල මග හරහා ගමන් කරවීමට සිදු වුවහොත් අති දරුනු, මහා ජලවීය ශක්තියක් මුදා හරිනු ඇත." [92] මෙම ප්‍රකාශය සෝවියට් සංගමය පිලිබඳ අඩු තක්සේරුවක් ලෙස හැඳින්වීම තරමක් අමාරු වැඩකි.

යුද නායකයෙකු ලෙස තැචර් ස්ටැලින්ට පුදන විශේෂ ප්‍රනාමය ගතහොත්, කුතුහලය දනවන කරුනක් නම් ඔහු මේ සඳහා විශ්ෂයෙන්ම "ජර්මන් ප්‍රහාරයේ මුල් මොහොත්වල" ස්ටැලින්ගේ ක්‍රියාකාරකම් තෝරා ගැනීම ය. 1941 ජූනි 22 දා ජර්මන් ආක්‍රමනයට ස්ටැලින් දැක්වූ ප්‍රතිචාරය පිලිබඳව බොහෝ ප්‍රශ්න පැනනැගී ඇති බව තැචර් හොඳින් දනී. හිට්ලර් සමග තමා යෙදුනු රාජ්‍යෝපායික සෙල්ලමේ පරිපූර්න බංකොලොත්කම එලිදරව් කරමින් සෝවියට් සංගමය මුලුමනින්ම විනාශභාග් වීමේ තර්ජනයට ලක් කල ජර්මන් ආක්‍රමනය පිලිබඳ ප්‍රවෘත්තියෙන් ස්ටැලින් මානසික වසයෙන් මුලුමනින්ම ඇද වැටුනි. තැචර් ඒ බව හොඳට දැන සිටින බව පැහැදිලිය. ඔහු අධෝලිපියක "ජර්මනිය සෝවියට් සංගමය ආක්‍රමනය කල කල්හි ස්ටැලින් බියෙන් උමතු වූ අතර ඔහු පෙරලා දැමීමට ඉඩකඩ තිබුනු බව සමහර පාඨ ග්‍රන්ථවල සඳහන් වේ... මෙම කියාපෑම් එස්.ජේ. මේන් විසින් "ස්ටැලින් 1941" නම් කෘතියේ විශ්වසනීය ලෙස ඛන්ඩනය කරනු ලැබ ඇත." [93] යයි සඳහන් කරයි.

ජර්මන් ආක්‍රමනයෙන් ඉක්බිත්තේ ස්ටැලින්ගේ ක්‍රියාකාරකම් වටා පැන නැගී ඇති විවාදය, වෙනත් ඉතිහාසඥයෙකු විසින් ලියන ලද ඊට වඩා බොහෝ දිගු ලිපියක් පිලිබඳ හුදු අටුවාවක් වූ මහාචාර්ය මේන්ගේ පිටු දෙකක කෙටි ලිපිය විසින් "විශ්වසනීය ලෙස ඛන්ඩනය කර ඇතැ"යි ප්‍රකාශ කිරීම වනාහී උගත් මත-නීර්නය විකාර රූපී බවට පත් කිරීමකි; දේශපාලන ක්ෂමාලාපවල නිමග්න වීමකි.[94] එපමනක් නොව නාසීන් සෝවියට් සංගමය ආක්‍රමනය කිරීමෙන් පසුව 1941 ජූනියේ දී ස්ටැලින් කල නොකල දේ පිලිබඳ ප්‍රයුක්තිය සෝවියට් සංගමය මත කඩා පාත්වූ ව්‍යසනයට වගකීම තක්සේරු කිරීමේ දී අත් කර ගන්නේ ද්විතීයක වැදගත්කමකි. සෝවියට් ජනයා පාත්‍රවූ භයංකර විනාශය වනාහී ස්ටැලින්ගේ පිලිවෙත් හා ක්‍රියාවල සෘජු විපාකයකි; ප්‍රධාන පෙලේ සෝවියට් හමුදා මාර්ෂල්වරුන් හා ජෙනරාල්වරුන් (තුකචෙව්ස්කි, යකීර්, ගමාර්නික්, බ්ලූචර්, යෙගොරොව්, සහ ප්‍රිමාකොව්) මරා දැමීම, 1937-38 රතු හමුදා බලකායන්හි සියයට 75ක් සමූලඝාතනය කිරීම සහ සෝවියට් බුද්ධිමතුන් සහ කම්කරු පන්තියේ හොඳම නියෝජිතයන් විනාශ කොට, හිට්ලර් ප්‍රකෝපයට පත් නො කිරීම සඳහා යයි සෝවියට් මිලිටරි ආරක්ෂකයන් අවුල් කොට දමා බිඳහෙලීම, ජර්මන් ආක්‍රමනයක් අත ලඟයයි ලද රහස් ඔත්තු මත ක්‍රියාත්මක වීම ප්‍රතික්ෂේප කිරීම යනාදිය මීට ඇතුලත් ය. මේ සියල්ල ගනන් නැති පොත් සහ උගත් ලිපි මගින් ඇතිතරම් ලේඛනගත කරනු ලැබ තිබේ. එහෙත් ඒවා නොතකා හරින තැචර් එක් සඟරාවක පලවූ පිටු දෙකක ලිපියක් දෙවන ලෝක යුද්ධය තුල ස්ටැලින්ගේ භූමිකාව පිලිබඳ ප්‍රශ්නය විසඳාලන්නේ යයි ප්‍රකාශ කරයි. [95]

## 'බ්‍රොන්ස්ටයින්ලා' පිලිබඳ තැචර්ගේ සමර්පනයෝ

ට්‍රොට්ස්කිගේ ජීවන චරිතය මුසාකරනය කිරීම පිලිබඳව ද ස්ටැලින් වෙනුවෙන් කෙරෙන කයෝර ක්ෂමාලාපයන් පිලිබඳව ද ගොඩගැසෙන බර යටතේ බුද්ධිමය අර්ථයකින් පමනක් නොව සදාචාරාත්මක අර්ථයකින් ද ගන්නා කල්හි කතුවරයාගේ අධ්‍යාසයන් එන්න එන්නම වැඩි වැඩියෙන් සැක සහගත බව පෙනී යයි. මේ අර්ථයෙන් කතුවරයා ට්‍රොට්ස්කිට සහ ඔහුගේ බිරිඳ නතාලියා සෙඩෝවාට "බ්‍රොන්ස්ටයින්ලා" යයි කරන සඳහන සටහන් කර ගැනීම වැදගත් ය. තැචර් විසින් ට්‍රොට්ස්කි දෙපල ඒ ආකාරයෙන් සඳහන් කැරුනු අවස්ථාවන් නවයකට නොඅඩු ගනනක් මට ලකුනු විය. සාමාන්‍යයෙන් එසේ කරනු ලැබුවේ ඔවුන්ගේ පෞද්ගලික ජීවන සැලසුම් හෝ ඔවුන් පිටුවහලේ එක් තැනක සිට තවත් තැනකට ගමන් කල ආකාරය විස්තර කිරීමේ දී ය. තැචර් අපට මෙසේ කියයි, " වියානාවේ දී බ්‍රොන්ස්ටයින්ලා ජීවත් වූයේ බොහෝ දුරට නයවලිනි." (52 පිටුව); "අවසානයේ දී,

බ්‍රොන්ස්ටයින්ලාට බාර්සිලෝනාවට ගමන් කිරීමට ඉඩ දෙන ලදි." (77 පිටුව); "බ්‍රොන්සටයින්ලා දේශ සීමාවෙන් එහාට ගෙන යන ලදහ." (164 පිටුව); ප්‍රින්කිපෝව "බ්‍රොන්ස්ටයින්ලාගෙන් වැඩි දෙනාට නිවහනක් බවට පත් විය." (165 පිටුව); "උදාහරනයක් හැටියට ප්‍රන්සයේ බ්‍රොන්ස්ටයින්ලාට විවිධ බඳුකර මගින් ලබාගත් ලිපිනය දූසිම් ගනනාවකට වැඩිය තිබුනේ ය." (188 පිටුව); "1937 ජනවාරි මැද බ්‍රොන්ස්ටයින්ලා උතුරු ඇමරිකාවට පැමිනීම" (189 පිටුව); යනාදී වසයෙනි. තැවර් මෙතරම් නිරතුරුව ට්‍රොට්ස්කි හා සෙඩෝවා "බ්‍රොන්ස්ටයින්ලා" යනුවෙන් සඳහන් කරන්නේ මන්ද? ප්‍රථමයෙන් ම එසේ සඳහන් කිරීමට කාරනා වසයෙන් හේතුවක් ඇත්තේ නැත. ඔහු සඳහන් කරන පුද්ගලයන් දෙදෙනා එම නම පාවිච්චි කලේ නැත. ට්‍රොට්ස්කිගේ බිරිඳ නතාලියා හඳුන්වනු ලැබුවේ ඇගේ නීත්‍යානුකූල වාසගමිනි. සෙඩෝවා යනුවෙනි. ලෙව් ඩේවිඩොවිච් (ට්‍රොට්ස්කි) සහ නතාලියාගේ දරුවන් දෙදෙනා - ලෙව් සහ සර්ජි - සෙඩොව් යන්න තම වාසගම ලෙස පාවිච්චි කලාහ. 1902න් පසු තමාව බ්‍රොන්ස්ටයින් යන නමින් හඳුන්වා නොගත් ට්‍රොට්ස්කි තමාගේ නීතිමය නම හැටියට සෙඩොව් යන්න පාවිච්චි කලේ ය.

ට්‍රොට්ස්කිගේ ජීවිතය ගැන නුහුරු කෙනෙකුට බැලූ බැල්මට පෙනිය හැකි පරිදි මෙය සුලුපටු කරුනක් නොවේ. ඔහු ගේ ජීවිතයේ අනෙක් සෑම කරුනක් මෙන් ම ඔහු ද ඔහුගේ පවුල ද අනන්‍යවූ නම දේශපාලන අර්ථභාරයක් ගත්තේ ය. 1937 ජනවාරි මාසයේ දී, ට්‍රොට්ස්කිගේ බාල ම පුතා කඩාකප්පල් චෝදනා උඩ සිරභාරයට ගනු ලැබූ අවස්ථාවේ ඔහුගේ නම සර්ජි බ්‍රොන්ස්ටයින් යයි සෝවියට් පුවත්පත් සඳහන් කිරීම ගැන ට්‍රොට්ස්කි තම අදහස මෙසේ දැක්විය:

> "1902 පටන් මම සෑම විටම ට්‍රොට්ස්කි යන නම දැරීමි. මගේ නීති විරෝධී තත්වය නිසා සාර් පාලනය යටතේ මගේ දරුවෝ ඔවුන්ගේ මවගේ සෙඩොව් යන වාසගමින් වාර්තා කරනු ලැබූහ. ඔවුන්ට පලපුරුදු වූ නම වෙනස් කිරීමේ තත්වයක් උද්ගත නොවන පරිදි සෝවියට් බලය පිහිටවූ පසු ද "සිවිල් කටයුතු" උදෙසා සෙඩොව් යන නම පවත්වා ගැනිනි. (සෝවියට් නීතිය අනුව, ස්වාමිපුරුෂයෙකුට තමාගේ බිරිඳගේ නම ගත හැකි විය. මෙය පතල කරුනකි.) මා ද මගේ බිරිඳ ද මගේ වැඩිමහල් පුතු ද පිටුවහලට යවනු ලබන විට අපේ ගමන් බලපත්‍ර සකස් කරන ලද්දේ ද සෙඩොව් යන වාසගම යටතේ ය. එහෙයින් මගේ පුත්තු කවර කලෙකවත් බ්‍රොන්ස්ටයින් යන නම පාවිච්චි නොකලහ. හරියට ම දැන් මේ නම එලියට අදින්නට තිබෙන උවමනාව කුමක් ද? උත්තරය පැහැදිලි යඃ ඊට හේතුව එහි පවත්නා යුදෙව් තාලය නිසා ය. මෙයට මා එකතු කල යුතු තවත් කරුනක් නම් මගේ පුතාට එල්ල කොට ඇති චෝදනාව වනාහී කම්කරුවන් ඝාතනය කිරීමට නොඅඩු එකක් බවයි. මෙය යුදෙව්වන් ක්‍රිස්තියානින් ගේ ලේ තමන්ගේ චාරිත්‍රවල දී යොදාගත්තේ යයි ඔවුන්ට චෝදනා කිරීමට වඩා සැබැවින්ම එතරම් වෙනස් ද."[96]

මෙහිලා ද වෙනත් අවස්ථාවල ද තමාගේ මුල් වාසගම පාවිච්චි කිරීම ට්‍රොට්ස්කි විසින් යුදෙව් විරෝධී උපායක් ලෙස හෙලා දක්නා ලද බැව් තැවර් දන්නේ නැතැයි සිතීම උගහට ය. එසේ යෙදීම කාරනා වසයෙන් ම සාවද්‍යයයි දැන දැනම, තැවර් "බ්‍රොන්ස්ටයින්ලා" යනුවෙන් සඳහන් කරන්නේත්, ට්‍රොට්ස්කි පවුල සෙඩොව් යන නමින් නොහඳුන්වන්නේත් මන්ද? මෙහි දී යම් නීච ගනන් බැලීමක් වැඩ කර ඇති බවට ඇතිවන යුක්තිසහගත සැකය අහෝසි කිරීමට සදාචාරාත්මක වගකීම තැවර් මතට වැටෙයි. මා කියන්නේ තැවර් යුදෙව්-විරෝධියෙකුය යන්න නොවේ. එහෙත් නිසැක කරුන නම්, කුමන හේතුවක් නිසා හෝ ඔහු යලියලිත් පාඨකයාගේ අවධානය ට්‍රොට්ස්කිගේ යුදෙව් උපත දෙසට යොමු කිරීමට උත්සාහ දරන බව නම් නිසැක ලෙසම පෙනී යන බවයි.[97] තමා එසේ කිරීමට හේතුව තැවර් පැහැදිලි කල යුතු ය.

## තැවර් ඩේවි කොමිසම මුසාකරනයට ලක් කරයි

මොස්කව් නඩු විභාගවලට ද ඔවුන්ගේ චෝදනා බොරු බව ඔප්පු කිරීමට ද ට්‍රොට්ස්කි ගෙන ගිය අරගලයට ද තැවර් පිටු දෙකක් පමන යොදවයි. ඩේවි කොමිසමේ සැකැස්ම ද "බ්‍රොන්ස්ටයින්ලා" එවකට ජීවත්ව සිටි[98] 1937 අප්‍රේල් මෙක්සිකෝවේ එහි සැසිවාර පැවැත්වූ ආකාරය ද ඔහු සාකච්ඡා කරයි. නඩුව පැවැත්වුනු පටිපාටිය ද ලියොන් ට්‍රොට්ස්කිගේ සාක්ෂ්‍ය ද කෙටියෙන් සමාලෝචනය කිරීමෙන් පසු තැවර් කොමිසමේ සොයාගැනීම් කරා එලඹෙයි. ඔහු මෙසේ ලියයිඃ "*මොස්කව් නඩු විභාග සත්‍යයට අවිශ්වසනීය මග පෙන්වීමක් යයි ද ට්‍රොට්ස්කිට එරෙහි චෝදනා ඔප්පු වී නැතැයි*" ද ප්‍රකාශ කරන ලදී.[99]

මෙය වනාහී ඩේවි කොමිසමේ සොයා ගැනීම් මුසාකරනයට භාජන කිරීමකි. 1937 සැප්තැම්බර් 21 දින කොමිෂන් සභාව තම සොයා ගැනීම් ප්‍රකාශයට පත් කලේ ය; ඒ අනුව සොයා ගැනීම් 23ක් තිබුනි. ඉන් පලමු 21 සෝවියට් අභිචෝදකයන්ගේ කියා පෑම් සඳහා තීරනාත්මක විය. තීරනාත්මක සංක්ෂිප්ත නිගමන 22 හා 23 සොයාගැනීම්වල දී ප්‍රකාශ කරන ලදී. එහි මෙසේ සඳහන් යඃ "22. එහෙයින් අපි මොස්කව් නඩු සිතාමතා ගොතන ලද අවනඩු යයි (frame up) නිගමනය කරමු. 23. එහෙයින් අපි ට්‍රොට්ස්කි [සහ ඔහුගේ පුතා] සෙඩොව් නිවැරදිකරුවන් තීන්දු කර සිටිමු."[100]

ඩේවි කොමිසම විසින් පාවිච්චි කරන ලද වචන ද තැචර් විසින් තෝරා යොදා ගන්නා ලද වචන ද අතර වෙනස ලකුනු කරගන්න. කිසියම් නඩු ඇසීමක් " අවනඩුවක්" යයි (ඩේවි කොමිසම පාවිච්චි කලේ එම වචනය) නම් කිරීමත් "සත්‍යයට අවිශ්වසනීය මග පෙන්වීමක්" යැයි කීම ද (තැචර් පාවිච්චි කරන ලද වචනත්) අතර ප්‍රගාඪ වෙනසක් පවතී. අවනඩුවක් වනාහී චූදිතයා වැරදිකරු යයි කල්තබා තීර්නය කරන ලද තීන්දුවක් නිර්මානය කිරීම උදෙසා බොරු සාක්ෂ්‍ය ගොතා අටවන ලද ව්‍යාජ-නීතිමය පටිපාටියකි. එය හුදෙක් "සත්‍යයට අවිශ්වසනීය මග පෙන්වීමක් පමනක් නොවේ" එහි අරමුන වන්නේ සත්‍යය වසන් කිරීම ය. ඒ සඳහා එය ව්‍යාජ-නීතිමය වහන්තරාවක් යටතේ චෝදනා එල්ල කරන ලද තැනැත්තෙකු සිරගත කිරීමට හෝ මරන දන්ඩනයට පත් කිරීම සඳහා බොරු යොදාගනී. ඩේවි කොමිෂන් සභාවේ 22 වන සොයාගැනීම සරලව උපුටා දැක්වීමට තැචර්ට හොඳටම ඉඩ තිබුනේ ය. ඒ වෙනුවට කොමිෂම විසින් යොදාගනු ලැබූ තනි වචනය අවනඩුව (ෆ්‍රේම් අප්) යන්න වෙනුවට වචනය පහක් - (සත්‍යයට අවිශ්වසනීය මග පෙන්වීමක් යන අර්ථ ගත්) "අන්රිලයබල් ගයිඩ් ටූ ද ට්‍රෲත්" යොදා ගති; ඒ කොමිෂන් සභාව කී දෙයට වඩා මුලුමනින්ම වෙනස් දෙයක් කියා පෑමට ය.[101]

(ඩේවි කොමිසම විසින් දෙන ලද) 'නිවැරදි කරුය' (නොට් ගිල්ටි) යන සොයා ගැනීම ද "ඔප්පු නොකරන ලදි" (අන් ප්‍රෲවන්) තැචර් විසින් දෙන ලද තීන්දුව ද අතර අති මූලික නීතිමය වෙනසක් ද පවතී. 'නොට් ගිල්ටි' චූදිතයා නිවැරදිකරුය යන තීන්දුවක් නිර්දෝෂීභාවයේ පූර්වානුමිතිය අඛන්ඩව තබයි. 'අන් ප්‍රෲවන්' යන තින්දුවක් ඊට වඩා බෙහෙවින් වෙනස් දෙයකි. එහි අර්ථය නම්, 'වැරදිකරු' යයි තීන්දුවක් දීමට ඇති තරම් සාක්ෂ්‍ය නොතිබුනු නමුත් චූදිතයා, ඔහුට එල්ල කෙරුනු චෝදනාවට හේතු වූ අපරාධ කරන්නට හොඳටම ඉඩ තිබුනේ යයි විශ්වාස කිරීමට තරම් සාරභූත හේතු ජූරි සභාව අතට පත්වූ බවය. ග්ලාස්ගෝ නගරයේ ජීවත් වෙමින් උගැන්වීම කල තැචර් "නොට් ගිල්ටි" සහ "අන් ප්‍රෲවන්" අතර වෙනස හොඳට දනී. ස්කොට්ලන්ත නීතියේ එක් සුවිශේෂතාවක් නම්, එංගලන්තයේ පවත්නා පටිපාටිය මෙන් නොව, එය ජූරි සභාවලට "අන් ප්‍රෲවන්" යන තීන්දුවට එලඹීමට ඉඩ තැබීම ය. මෙම ඊනියා 'තුන්වන තීන්දුව' (තර්ඩ් වර්ඩික්ට්) චූදිතයා පිටුපස ඉතුරු කර තබන සදාචාරාත්මක සෙවනැල්ල නිසා ශතවර්ෂ ගනනාවක් තිස්සේ මේ පිලිබඳ සැලකියයුතු නීතිමය විවාදයක් පැවැතී තිබේ.[102] තැචර් "නොට් ගිල්ටි" යන වචන වෙනුවට "අන්ප්‍රෲවන්" යන වචන යොදාගැනීම අහිංසක අත් වැරැද්දක් යයි විශ්වාස කරන්නට හැකි වන්නේ තදබල බොලඳයෙකුට පමනි. ඩේවි කොමිෂන් සභාවේ සොයාගැනීම් සිතාමතා මුසාකරනය කිරීම පිලිබඳව තැචර් නිසැකව ම වැරදිකරු ය.

මෙවන් මුසාකරනයක අරමුන කුමක් වන්නේ ද? යි පාඨකයා ඇසීමට ඉඩ තිබේ. මෙය එතරම් ම බරපතල ප්‍රශ්නයක් ලෙස කෙනෙකු සැලකිය යුත්තේ මන්ද? අප දැනට ම පරීක්ෂනයට බඳුන්කර ඇති ස්වේන් හා තැචර්ගේ ක්‍රමවිධින් ගැන මෙහි දී සැලකිලිමත් විය යුතු ය. මොවුන් දෙදෙනා එකිනෙකාගේ උධෘත ගෙනහැර දක්වන අතර, වෙනත් අය ද මොවුන්ගෙන් උපුටා දක්වන තතු තුල මුසාකරනයේ වෛරසය උදාසීන ශාස්ත්‍රාලිකයන් සමූහය තුල හොරෙන් හොරෙන් පැතිරී ගොස් පලල් ජනකාය තුලට ද පිවිසෙයි. මෙම සුවිශේෂ අවස්ථාව් දී ඩේවි කොමිෂන් සභාවේ තීන්දුවේ යෝධ ප්‍රාරම්භක ශක්තිය දියාරු කර මුසාකරනය කෙරේ. මොස්කව් නඩුවිභාග ගොතන ලද අවනඩු (ෆ්‍රේම් අප්) යයි හෙලා දැකීම ද, ට්‍රොට්ස්කි හා සෙඩොව් නිසැකයෙන් ම නිවැරදිකරුවන් යයි කොමිෂන් සභාව විසින් තහවුරු කිරීම ද ඓතිහාසික මතකයෙන් ගිලිහෙන කල්හි තැචර්ගේ සූත්‍රය - අනෙකුත් අපරීක්ෂ ඉතිහාසඥයන් විසින් යලි යලිත් භාවිතයට ගනු ලැබ - කලින් තහවුරු කරනු ලැබූ කරුනු හා වෛෂයික සත්‍යය බාදනය වීමට සම්මාදම් වෙයි.

## ට්‍රොට්ස්කිගේ ඓතිහාසික භූමිකාව පිලිබඳ ව තැචර්ගේ අවසන් සැඳහුම්

විකෘතීන්, අර්ධ සත්‍යයන් සහ පරිපූර්න මුසාකරනයන්ගෙන් පිරුනු පිටු 200කට පසු අපි ට්‍රොට්ස්කි පිලිබඳ තැචර්ගේ අවසාන තක්සේරුව කරා එලඹෙන්නෙමු. "ට්‍රොට්ස්කි ශ්‍රේෂ්ඨ දේශපාලන නායකයකු හෝ අනාගත වක්තෘවරයෙකු නො වේ. ඔහු තමාගේ දේශපාලන ජීවිතයෙන් වැඩි පංගුව විපක්ෂගතව සුලුතරයක ආධාරය පමනක් ලද මතයන් ප්‍රකාශනය කරන්නෙකු ලෙස ගත කලේ ය."[103] තැචර්ගේ මෙම නිගමනයට ඔහුගේ පාඨකයන් ප්‍රතිචාර දැක්විය යුත්තේ, "හොඳයි, තැචර් මහාචාර්ය තුමනි එය සරල ව ම ඔබගේ මතය වනවා පමනි" යනුවෙනි. එහෙත් සත්තකින්ම එය වනාහී විශ්වසනීය වියත් පර්යේෂනයක් පදනම් කරගත් මතයක් නො වේ. එහෙයින් එම මතය විශේෂයෙන් බරපතල ව සැලකිල්ලට ගැනීමට පාඨකයාට ඇති හේතුවක් නැත. මෙහි ලා සිහියට නැගෙන්නේ හෙගල්ගේ අවවාදය යි, "නග්න මතාන්තර මාලාවකට වඩා නිරර්ථවන්නේ වෙන කුමක් ද? නොවැදගත් වන්නේ වෙන කුමක් ද?"[104] ඔහුගේ මතයේ පදනම - එනම් ට්‍රොට්ස්කි තමාගේ ජීවිතයෙන් වැඩි කොටසක් විපක්ෂගතව සිටියේ ය යන්න - ගතහොත් ඉන් එලිදරව් කෙරන්නේ තැචර් තීන්දුවට භාජන කරන විප්ලවවාදී නායකයා ගැන නොව තැචර්ගේ ම අදහස් ද චරිතය ද පිලිබඳ ව ය.

තැචර් තවදුරටත් මෙසේ ද කියයිඃ

> "ට්‍රොට්ස්කිගේ කෘතීන්ගේ දිගු කාලීනව වටිනා යමක් පවතී ද? නැතහොත්, ඔහුත් ඔහුගේ ලේඛනත් අදාල වූයේ ඔහුගේ සමයට

සහ අත්දැකීමට පමනක් ද? මෙම ප්‍රශ්නයට පිලිතුර අඩු ගනනේ යම් තරමකට, රැඳී පවතින්නේ කෙනෙකු මාක්ස්වාදය අගය කරන තරමට ය. මාක්ස්වාදියෙකු ලෙස ට්‍රොට්ස්කි අගය කරන ප්‍රමානයට ය.

"පසුව කී ප්‍රයුක්තියෙන් ආරම්භ කලහොත්, ට්‍රොට්ස්කි මාක්ස්වාදී චින්තනයට කුමන හෝ ස්ථිරසාර ප්‍රතිපදානයක් කලේ ද යන්න සැක සහගත ය. ඔහු මාක්ස්ගේ මූලික ලියවිලිවලින් සමහරක් ගැන දැන නොසිටියා වන්නට ද හොඳටම ඉඩ තිබේ. උදාහරනයක් හැටියට රෙවලූෂන් බිට්‍රේඩ් (විප්ලවය පාවාදීම) යන කෘතියේ ට්‍රොට්ස්කි කිහිප වතාවක් ම අවධාරනය කලේ *මාක්ස්ට රුසියාව ගැන කීමට කිසිම දෙයක් තිබුනේ නැතැයි කියා ය*, දියුනු ධනේශ්වර රටවල් තුල සමාජවාදී විප්ලවය ඇරඹේ යයි ගුරුවරයා අපේක්ෂා කල බවය. ඔහු 'පසුගාමී' රුසියාව ධනවාදය මගහැර ගොවිජන සාමූහිකය මත පදනම්ව සමාජවාදය කරා සෘජු සංක්‍රමනයක් අත් කර ගැනීමට සමත්වේ ද යන මාක්ස්ගේ ආසක්තය නොතකා හරී."[105]

කතුවරයා මෙම ඡේදයේ දී මෝහය ද උද්ධච්චය ද සම පංගුවට අච්චාරු කර ගනී. සෝවියට් සංගමයේ බිඳ වැටීමට පෙර මේ ජාතියේ රචනා ස්ටැලින්වාදී සඟරා දුසිම් ගනනාවක පලවිය හැකිව තිබුනි. "මාක්ස්ට රුසියාව ගැන කීමට කුමක් හෝ තිබුනේ නැතැ"යි ට්‍රොට්ස්කි කියා සිටියේය යන නිශ්චිත අභ්‍යර්ථනය වනාහී ට්‍රොට්ස්කි ලියූ දෙයෙහි කයොර විකෘතියකි. ට්‍රොට්ස්කි පැහැදිලි කලේ මාක්ස්ගේ ඓතිහාසික සංකල්පයන් යාන්ත්‍රිකව යෙදීම මගින් සෝවියට් සමාජය පිලිබඳ විශ්ලේෂනයක් ලබා ගත නොහැකි බව ය. [106] මෙහිලා ට්‍රොට්ස්කි ප්‍රදර්ශනය කලේ මාක්ස්ගේ කෘතිය පිලිබඳ තමාගේ නොදැන්ම නොව මාක්ස්වාදය කරා ඔහුගේ නිර්මානාත්මක ප්‍රවිෂ්ටය යි. සෝවියට් සංගමය තුල ආයුධධාරී පරිපාලකයා - සමාජ අසමානතාව සෝවියට් සංගමය තුල ආයුධධාරී පරිපාලකයා - සමාජ අසමානතාව පොලිස් බලයෙන් තහවුරු කරන්නා - ලෙස නිලධරයේ උල්පත් සහ සමාජ කර්තව්‍යය පැහැදිලි කිරීම සඳහා ට්‍රොට්ස්කි මාක්ස් විසින් සිය ජර්මන් අයිඩියලොජි කෘතියේදී ඉදිරිපත් කරනලද 'පොදු භාවයට පත් අගහිඟකම්' පිලිබඳ සංකල්පය යොදා ගත්තේ ය.

ට්‍රොට්ස්කි 1881 මාක්ස්ගේ ලියවිලි ගැන දැන සිටියේ නැතැයි ද එපමනක් නොව ට්‍රොට්ස්කි තමාගේ ම නොනවතින විප්ලව න්‍යාය සහ මාක්ස්ගේ කෘතිය අතර සම්බන්ධතාවය දැන සිටියේ නැතැයි යන්න ද පහසුවෙන් නිෂ්ප්‍රභවන්නකි. මෙහි දී තැචර් ට්‍රොට්ස්කිගේ 1928 ලියන ලද "මාක්ස්වාදය ද කම්කරු පන්තතික සහ ගොවි ජන විප්ලව අතරේ සම්බන්ධතාවය"නම් ලිපිය කියවා නැති බව පෙනී යයි. ට්‍රොට්ස්කි මාක්ස් ද රුසියන් විප්ලවවාදිනී වේරා සසුලිච් ද අතර 1881 ගනුදෙනු වූ ලිපි නිශ්චිතව ම සමාලෝචනය කලේ ය. එම ලිපිවලදී මාක්ස් පසුව (තැචර් කියන පරිදි 1881 දී නොව) 1882 ජනවාරියේ දී සාරාංශ කරන ලද න්‍යායික ප්‍රයුක්තීන් සමාලෝචනය කලේ ය. තමා මාක්ස්ගේ දරන්නා වූ බුද්ධිමය නය භාරය ගැන සඳහන් කරමින් ට්‍රොට්ස්කි මෙම ලිපියේ මෙසේ ලිවී ය; "නොනවතින විප්ලවය පිලිබඳ න්‍යාය වනාහී මාක්ස් සහ එංගල්ස්ගේ අතිශයින් වැදගත් එකක් විය.

ඉතින් අපට මෙහිලා දක්නට ලැබෙන්නේ තමාගේ ම ව්‍යාකුලත්වයට ගොදුරු වූ තැචර්, ට්‍රොට්ස්කි-මාක්ස් විසින් රුසියාව පිලිබඳව ලියන ලද තීරනාත්මක ලියවිලි ගැන දැන සිටියේ නැතැයි තර්ක කරන සැටි ය. එහෙත් අපට මෙහි දී දක්නට ලැබෙන්නේ තැචර්ගේ මේ අරුම පුදුම උපන්‍යාසය වනාහී අන් කිසිවක් නොව ඔහු තමාගේ මූලික බුද්ධිමය "ගෙදර වැඩ" පැහැර හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ය.[108]

ට්‍රොට්ස්කිගේ අදාලකම ගැන තැචර් විසින් මතු කරනු ලැබූ ප්‍රශ්නය ගැන නම්, උගත් මහාචාර්යතුමා අපට කියා දිය යුතුව ඇත. එනම් ට්‍රොට්ස්කිගේ අනදාලබව ප්‍රකාශයට පත් කිරීම සඳහා පිටු 240ක ග්‍රන්ථයක් තමා නිෂ්පාදනය කලේ මන්ද යන්නයි. තැචර්ගේ ප්‍රථම ට්‍රොට්ස්කි විරෝධී ව්‍යාපෘතිය නියෝජනය කල මන්දායුෂ්ක වූ ජර්නල් ඔෆ් ට්‍රොට්ස්කි ස්ටඩීස්(ට්‍රොට්ස්කි අධ්‍යයන සඟරාව) නම් සඟරාව පලකිරීමට තැචර් පෙරකල්හි ග්ලාස්ගෝ සරසවියේ දී තම සගයාව සිටි ජේම්ස් ඩී වයිට් සමග එක්ව වැඩ කලේ මන් ද? ග්ලාස්ගෝ සරසවියේ තැචර් ගත කල සමයේ සිට එන තවත් සගයෙකු වූ ස්වේන් පිටු 236 ට්‍රොට්ස්කි (හෙලාදක්නා) තවත් චරිතාපදානයක් ලිවීම කලේ මන්ද?

ස්ටැලින්ගේ අදාලභාවය පිලබඳව තැචර්ට නම් සැකයක් නැති බව සලකුනු කර ගැනීම වටනේ ය. ඒකාධිපතියාගේ මරනයේ 50ස්වන සංවත්සරයට ආසන්න සමයේ පල කරන ලද අධ්‍යයනයන් ගනනාවක් පිලිබඳ සමාලෝචනයක දී තැචර් තමාගේ ජටාව තුල බමන්නේ කවර බිඟුන් ද දැයි හෙලිදරව් කරමින් " ස්ටැලින්වාදයේ යහපත් වර්තනයක්" කෙරේ එක්තරා සංකාවක් ප්‍රදර්ශනය කලේය. ඔහු මෙසේ ද කීය. " ස්ටැලින් දිගින් දිගට ම සිත් ඇදගනී. සදාචාරාත්මක දෙගිඩියාවේ ක්ෂනයන් සිත තුල ජනනය කරයි."[109] 'මොන ජාතියේ දෙගිඩියාවක් දැයි සිතීමට අපි පෙලඹෙමු. සමාජවාදීන් මුලුමහත් පරපුරක් ම මරා දමා, ඔක්තෝබර් විප්ලවයේ මූලධර්ම පාවාදුන් සහ සෝවියට් සංගමය විනාශ කිරීමට පාර කැපූ ක්‍රියාවලිය ඇරඹූ මෙම ලේ නාගත් කෲර පාලකයා පිලිබඳ ව කුමන සදාචාරාත්මක දෙගිඩියාවක් ද?

## සමාප්තිය

තැචර් මහතාගෙත්, ස්වේන් මහතාගෙත් වෙලුම් අධ්‍යයනය කිරීම අමිහිරි අත්දැකීමක් වූ බව නොකියා බැරිය. මෙම ලියවිල්ල සෑහෙන තරම් දික් වුවත් මා එය තුල ඔවුන්ගේ කෘතිවල දක්නට ලැබෙන සියලු විකෘතීන්ට හා මුසාකරනයන්ට පිලිතුරු දී නැත. එවන් පරිපූර්න ගනුදෙනු බේරා ගැනීමක් සඳහා වෙනම ග්‍රන්ථයකට නොඅඩු දෙයක් අවශ්‍ය වනු ඇත. එහෙත් මෙම සමාලෝචනය විසින්, එම චරිතාපදාන දෙකම උගත් විශ්වසනීයත්වයේ බින්දු මාත්‍රයක් හෝ දරන්නේ නැතැයි තහවුරු කර ඇති බව මම විශ්වාස කරමි. එහෙත්, තවමත් ප්‍රශ්න ඉතුරුව පවතීඃ මෙම පොත් ලියන ලද්දේ මන්ද? ඒවායේ අරමුන කුමක් ද? මා සිතන්නේ මෙයට පිලිතුර සෙවිය යුත්තේ දේශපාලනය තුලය කියා ය. තැචර් තමාගේ කෘතියේ අවසානයේ දී තම විෂයයේ, ට්‍රොට්ස්කිගේ, අදාල බව පිලිබඳව සමපේක්ෂනය කරන නමුත්, ට්‍රොට්ස්කි ඉතිහාසයේ ඔයතරම් අද්දරට වැටී සිටින්නෙකු යයි තැචර්ම විශ්වාස කරන්නේ නැති බව නම් පැහැදිලි ය. ට්‍රොට්ස්කි පිලිබඳව තැචර්ට පවත්නා වූ ග්‍රස්ත ආසක්තය (එල්බ ගැනීම) විසින් ඇඟවෙන්නේ ඉහත සඳහන් දෙයට වඩා බෙහෙවින් වෙනස් මතයක් ඔහුට පවත්නා බවය. ඉතින්, ඔහුට එවැනි ග්‍රස්තියක් තිබීම පුදුමයට කරුනක් නොවේ. මන්ද යත්, ඓතිහාසික පෞරුෂයක් හැටියට ට්‍රොට්ස්කිගේ අර්ථභාරය ජාත්‍යන්තර පන්ති අරගලයේ රිය සක සමග බැඳී පවත්නා හෙයිනි. ට්‍රොට්ස්කිගේ අදාල භාවය නිර්නය කර ගැනීම සඳහා වෙනත් ප්‍රශ්න ගනනාවක්ම ඇසිය යුතුව තිබේ. සමාජවාදයේ අදාල බව කුමක් ද? මාක්ස්වාදයේ අදාල බව කුමක් ද? ධනවාදය අලුත් හා ස්ථිර ස්ථාවරත්වයක් තහවුරු කර ගෙන පවතී ද? "ධනවාදයේ අර්බුදය" පිලිබඳ සංකල්පය ම ඓතිහාසික ව යල්පැනගොස් පවතී ද? ඉතිහාසය තුල ද ට්‍රොට්ස්කිගේ අදාලත්වය පිලිබඳව ද සමකාලීන ලෝකය පිලිබඳව ද සලකා බලන කල්හි ඇසිය යුතු වූ ප්‍රශ්න මේවා ය.

වෛෂයික වර්ධනයන්ගේ එලියෙන් බලතොත් ට්‍රොට්ස්කිගේ අදහස් කිසිසේත් ම එතරම් ම දුරස්තයයි පෙනීයන්නේ නැත. ප්‍රථමයෙන්ම තාක්ෂනයේ වර්ධනයන් ද නිෂ්පාදන ක්‍රියාවලිය මත ඒවායේ බල පෑම ද පැරනි ජාතික-රාජ්‍ය ව්‍යූහයන් තදබල දෙදරීම්වලට පාත්‍ර කරන්නා වූ භුගෝලීකෘත ආර්ථිකයක් ජනිත කර තිබේ. එපමනක් නොව ඇමරිකා එක්සත් ජනපදයේ ලෝක ආර්ථික ස්ථානයේ ප්‍රපාතගාමී පරිහානිය විසින් අන්තර්-රාජ්‍ය සබඳතා විධිගත කරන්නා වූ ද භුගෝලීය ස්ථාවරත්වය නඩත්තු කරන්නා වූ ද නව ලෝක පර්යායක් පැන නැගීමට පවත්නා ඉඩකඩ සැලකියයුතු ආකාරයෙන් සීමා කර දැමෙයි. ලෝක ධනේශ්වර ක්‍රමය ගමන් කරමින් සිටින්නේ 1914-1945 සමයේ පරිමාන පද්ධතිමය බිඳවැටීමක් කරා ය. පවත්නා භූගෝලීය ආර්ථික සහ භූගෝලීය දේශපාලන පර්යායේ බිඳෙන සුලු බව ප්‍රාදේශීය පන්ති පදනම් මත පදනම් වූ සමාජ ආතතීන් විසින් තව දුරටත් උග්‍ර කරනු ලැබ තිබේ. ගත වූ විසිපස් වසර තුල කම්කරු පන්තියේ පැරනි පෘථුල මහජන පක්ෂ සහ සංවිධානයන්ගේ බිඳ වැටීමක් අපට දක්නට ලැබී තිබේ. මහජනතාව තුල කිසියම් මට්ටමක විශ්වසනීය භාවයක් දරා සිටින්නා වූ දේශපාලන පක්ෂයක් ලෝකයේ කොතැනක හෝ පවතී යයි සිතීම උගහට ය. පැරනි කොමියුනිස්ට් පක්ෂ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සහ ලේබර් පක්ෂ - මෙන්ම ස්ටැලින්වාදී පක්ෂ බොහොමයක් එක්කෝ බිඳ වැටී තිබේ - එසේත් නැතහොත් තරයේ දූෂිත වූ තන්ත්‍රයක් විසින් පවත්වා ගෙන යනු ලබන සංවිධානය ලෙස වැනිවැනී ඔහේ ගමන් කරමින් සිටිති. ඔවුන් "කම්කරු පන්තිය" යි විස්තර කිරීම වනාහී කම්කරු පන්තික යන පදයේ ම ඓතිහාසික අර්ථය මුලුමනින්ම අපයෝජනය කිරීමකි. මෙම පක්ෂ සියල්ල පැරනි සම්ප්‍රදායික ධනේශ්වර පක්ෂ තරම් මැ ධනවාදයේ ද අධිරාජ්‍යවාදී ආසක්තයන්ගේ ද ආරක්ෂකයන් ලෙස ක්‍රියාත්මක වන දක්ෂිනාංශික පක්ෂයෝ ය. ස්ටැලින්වාදය සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පතිසංස්කරනවාදය- පදනම් කර ගත් සකල ආකාර කම්කරු පන්ති පක්ෂවල මෙම බිඳ වැටීම සිදුවන්නේ ඉහල නගින්නාවූ සමාජ අසමානතාව ද උග්‍රවන්නා වූ පන්ති ප්‍රතිසතිතාවන් ද පිලිබඳ පසුබිමක් තුල ය. ගැඹුරු වන්නා වූ සමාජ අසහනය අවුරා ධනේශ්වර පද්ධතියේ ස්ථාවරත්වයට තර්ජනයක් නොවන පරිදි වෙනත් මාවත්වලට හරවා යැවීමට අවශ්‍ය මාධ්‍යයන් ද විශ්වසනීය භාවය ද මෙම සංවිධානවලට සරලව ම ඇත්තේ නැත. එක්තරා මොහොතක දී පන්ති සට්ටනය උග්‍රවීම බුද්ධිමය හා දේශපාලන ප්‍රකාශනයක් අත්කර ගනු ඇත. වත්මන් පවත්නා තත්වයට විකල්පයන් සෙවීම ඉස්මත්තට එනු ඇත. මෙය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසය සහ අතීතයේ විප්ලවවාදී අරගලවල ඉතිහාසය පිලිබඳ උනන්දුව යලිත් පන නංවා වර්ධනය කරනු ද ඇත. එවන් වාතාවරනයක් වැඩී ඒම ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවිතය සහ වැඩ කටයුතු පිලිබඳ අලුතින් වැඩුනු උනන්දුවකට මග පාදනු සහතික ය. කම්කරුවන්ගේ හා ශිෂ්‍යයන්ගේ රැඩිකලීකරනයේ පසු ගිය රැල්ලේ දී සිදු වූයේ මෙයයි. ධනේශ්වර පන්තියේ වඩාත් දේශපාලනිකව සිතන මතන කොටස් මෙම අන්තරාය වටහා ගෙන ඉන් බියට පත්ව සිටිති. 1991 විශ්වවිද්‍යාලය විසින් පල කරන ලද ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදය පිලිබඳ විශ්වකෝෂ සම වෙලුමේ රොබර්ට් රේ ස්පෙන්සර් ගේ දුර දිග දක්නා සුලු වදන් මෙහි ලා මතක් කර ගැනීම වටී.

"ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදයට ස්ටැලින්වාදයේ උරුමකරනයන්ට තිබුනු ආකාර මනා සේ ස්ථාපනය කරගත් තන්ත්‍රයක

ආවරනය නැත. එසේ වුව ද විවිධාකාර රටවල් ගනනාවක මෙම ව්‍යාපාරය දිගින් දිගටම පැවතීම ද ලෝකයේ බොහෝ ජාතීන් අතර දේශපාලන අස්ථාවරත්වය ද තුල කිසියම් රටක ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් දෘෂ්‍යමාන අනාගතයේ දී බලයට පත්වීම ට ඉඩ පවතින්නේ ය යන ශක්‍යතාවය මුලුමනින්ම නොතකා හැරිය නොහැකි වේ."[110]

අප එලඹී සිටින්නේ පූර්ව භංග යුද්ධයේ යුගයකට ය. (අප විමර්ශනයට භාජන වූ) ඉහත කෘතීන් නියෝජනය කරන්නේ ට්‍රොට්ස්කිවාදයේ ආනුභාවය යලි පැන නැගීමට පෙරාතුව කල්බලා එල්ල කරන ලද කිසියම් වර්ගයක පූර්වභංගික ප්‍රහාරයකි. ස්වේන් හා තැචර් විසින් නිෂ්පාදනය කරන ලද ආකාර චරිතාපදාන ලිවීමේ කොන්ත්‍රාත්තු රුට්ලෙජ් හා ලෝන්ග්මන් වැනි සුප්‍රසිද්ධ ප්‍රකාශක සමාගම් විසින් දෙනු ලබන්නේ මේ වර්ගයේ අයට ය.

දේශපාලන අර්බුදය ප්‍රගාඪ බුද්ධිමය අර්බුදයක් සමග අන්තර් ඡේදනය වෙයි. මෙම තුච්ඡ පොත් දෙකට ලැබී ඇති යහපත් පිලිගැනීම අප විග්‍රහ කරන්නේ කෙසේ ද? එය වනාහී ශතවර්ෂ කාලක් තරම් කාල පරිච්ඡේදයක් තුල පශ්චාත් නූතනවාදය ආශ්‍රිත කරගත් වෛශයික සත්‍යය පිලිබඳ කාරනයම ප්‍රතික්ෂේප කරන්නා වූ සැබැවින්ම ප්‍රතිගාමී චින්තන ක්‍රමයක් ආධිපාත්‍යය දැරීම සමග බැඳී පැවතීම නිසා යයි මම විශ්වාස කරමි. මෙම විචාර ලිපිය තුල මම කිහිප වතාවක් ම ඊ.එච්. කාර්ගේ කෘතීන් උපුටා දැක්වීමි. මම ඉදිරියටත් එය කරන්නෙමි. අඩ සියව'සකටද පෙර ඔහු 'යහපතට හා නපුරට ඔබ්බේ' යන කෘතියේ සූත්‍රගත කල නියට්ෂියානු මූලධර්මය ඉතිහාසය (ලිවීම) තුලට රිංගා ගැනීම ගැන අනතුරු හැඟැවී ය. එම මූලධර්මය නම්, කිසියම් මතයක සාවද්‍ය භාවය එය පිලිබඳව විරුද්ධ වීමට අපට හේතුවක් නොවේ."[111] එකම ප්‍රයුක්තිය වනාහී කථාන්තරයක (භාෂිතයක) අභ්‍යන්තර සුසංගතභාවය ම පමනි. එය මිනිය හැක්කේ එහිම මිම්මෙන් පමනක් ය යන අභ්‍යර්ථනය බරපතල ශාස්ත්‍රීය කර්තව්‍යයන්ට තරයේ සතුරුවනවා පමනක් නොවේ. තර්කානුකූල චින්තනයට ද සතුරු වේ. එවැනි මතයක් " ඕනෑම දෙයක් ඔට්ටු"යි යන වාතාවරනයකට එනම් මුසාකරනය රජකරන්නා වූ වාතාවරනයකට තුඩු දෙයි. විරුද්ධත්වයක් නැති කල්හි ඉතිහාසය පිලිබඳ මුසා ඇද බානු ලැබේ.

ඉතින් මෙයින් ඇඟවෙන්නේ කුමක් ද? මා මේ ලිපි මාලාව ආරම්භ කලේ මොස්කව් නඩු විභාග සහ ස්ටැලින්ගේ භීෂනය පිලිබඳ සමාලෝචනයකිනි. ඉතිහාසය මුසාකරනයෙන් ඇරඹූ දෙය අවසාන වූයේ මහා ජන ඝාතනයකිනි. මම එය පැහැදිලි කලෙමි. එම ක්‍රියාවලිය දැන් අපගේ සමයේ දී ද යලිත් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉතිහාසය තුල මුසාවාදයේ ගම්‍යයන් හා විපාකයන් සලකා බැලීමට කැමැති උවමනා කෙනෙක් විසින් කල යුතුව ඇත්තේ ඉරාකයේ යුද්ධය සඳහා මහජන මතය සකස් කිරීමට බොරු, "මහා විනාශක අවි පිලිබඳ බේගල්" යොදාගත් ආකාරය සලකා බැලීමය. එම පචය ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ මරනයට හේතු විය.

දැන් අලුත් පරම්පරාවක් ජීවිත තර්ජනයට ලක්කරන්නා වූ යෝධ ගැටලුවලට මුහුන දී සිටිති. සෑම තැනක ම මේ නව පරපුරට මුහුන දීමට සිදු වී ඇත්තේ අර්බුදයට හා ජරාජීර්නතාවයට ය. ලෝක ධනවාදයේ අර්බුදයට පිලිතුරු සොයා ගනු නොලැබුවහොත් මෙම ග්‍රහලෝකයේ ම අනාගතය ප්‍රශ්නයට භාජන වී පවතී. මෙම ප්‍රශ්නවලට පිලිතුරු සැපයීමේ ලා ඉතිහාසය අධ්‍යයනය කිරීම කේන්ද්‍රීය කියා කලාපයක් ඉටු කල යුතු ය. එහෙත් ඉතිහාස වාර්තාව මුසාකරනය කරනු ලැබූ කල්හි කෙසේ ඉතිහාසය උගන්නට ද? ලෝකයේ වැඩ කරන ජනතාවට ද තරුනයන්ට ද සත්‍ය දැනගැනීමට උවමනා ය. එය සොයාගැනීමට සහ ආරක්ෂා කිරීමට කරන්නා වූ අරගලය වනාහී මානව ප්‍රගතියේ ධාවක බලවේගය වේ.

**සටහන්**

[84]. තැචර්, 156 පි.

[85]. තැචර් 179-81 පිටු.

[86]. හිට්ලර්ගේ ජයග්‍රහනය කුමන ආකාරයකින් හෝ වැලැක්විය නොහැකිව තිබුනේ ය යන නිගමනය කිසිදු බරපතල සමකාලීන ඉතිහාසඥයෙකු විසින් හෝ ඉදිරිපත් කරනු නොලබයි. ඇත්ත වසයෙන්, අවධාරනය යොමුවී ඇත්තේ, හිට්ලර් බලයට පැමිනීමේ අතිශයින්ම ආපතික (අවශ්‍යයෙන්ම සිදු විය යුතු නුවූ) ස්වභාවය මත ය. වෙලුම් දෙකකින් සමන්විත බෙහෙවින් ගෞරවයට පාත්‍රවූ කෘතියක කතුවරයා වූ ඉයන් ක්‍රැන්ක්ෂෝ ලියා ඇති පරිදිඃ " හිට්ලර් බලයට පත්වීමේ අනිවාර්යතාවයක් තිබුනේ නැත. හින්ඩන්බර්ග් පැපන්ට කැමැත්තෙන්ම ලබා දුන් මන්ත්‍රී මන්ඩල විසිරුවීම ෂ්කෙලෙයිටර්ට ලබාදුන්නේ නම්, ව්‍යාවස්ථානුකූල වූ දවස් 60කට වැඩි කාල පරිච්ඡේදයක් උදෙසා රයික්ස්ටාගය කල් තැබුවේ නම්, හිට්ලර් චාන්සලර් (අගමැති) පදවියට පත් කිරීම වලක්වා ගැනීමට ඉඩකඩ තිබුනි. ආර්ථික අවපාතය පතුලෙන් උඩට ඒම ඇරඹීමත්, වහාම බලය අත්පත් කරගත්තේ නැති නම් නාසි ව්‍යාපාරය බිඳ විසිරී යාමේ විභවයත්, නිසා - අධිකාරවාදී පාලනයක් යටතේ වුව ඉක්බිත්ත මීට වඩා බෙහෙවින් වෙනස්වීමට ඉඩකඩ තිබුනි. (1933) ජනවාරි 30දා හින්ඩන්බර්ග්ගේ දොරකඩ සිටගෙන කැබිනට්ටුව වාදකරමින්, ජනාධිපතිවරයා පොරොත්තු කර තබන තතු තුල ද හිට්ලර්ගේ අගමැති ධුර ප්‍රාප්තිය ඉෂ්ට නොවීමට ඉඩකඩ තිබුනි. ඉතා දිලිඳු ආරම්භයක සිට බලය අල්ලා ගැනීම දක්වා හිට්ලර් ස්වකීය "අධිෂ්ඨානයේ විජයග්‍රහනය තුලින්" නැගී සිටීම නාසි මිථ්‍යා කතන්දරයක් පමනි. ඇත්ත වසයෙන් සිදු වූයේ බලයේ දොරමංවල සුපුරුදු වැසියෝ තම සාවද්‍ය දේශපාලන ගනන් බැලීම මගින් - නාසි නායකයාගේ කිසියම් ක්‍රියාවකට වඩා - ඔහුව චාන්සලර් (අගමැති) පුටුවේ හිඳුවීමට භූමිකාවක් ඉටු කල බවය." [හිට්ලර් 1889-1936; HUBRIS (නිව් යෝර්ක් - 1998, 424 පි.)]

[87]. තැචර්, 203 පිටුව.

[88]. කාර් මෙසේ ලිවීය. "සත්වන සම්මේලනය, කොමින්ටර්නයේ අරමුනු සෝවියට් සංගමයේ පිලිවෙත් සමග අනන්‍ය කිරීම පිලිබඳ ගැඹුරින් - මුල් බැස ගෙන තිබුනා වූ ද තීක්ෂන නිරීක්ෂකයාට දිගු කලක් තිස්සේ දැක ගත හැකිව තිබුනා වූ ද ප්‍රවනතාවය එලියට ගෙන ආවේ ය. මෙම සම්මේලනයේ පරස්වාචක සාර්ථකත්වයෙන් ඉක්බිති, මෙම සංස්ථාව (කොමින්ටර්නය) එහි යථාර්ථවත් බව අහෝසි කරගෙන තිබුනු බවක් පෙනී ගියේ ය. තවත් සම්මේලනයක් හෝ කොමින්ටර්නයේ විධායක මන්ඩලයේ (අයිකේකේ ) ප්‍රමුඛ සැසිවාරයක් හෝ යලිත් කැඳවනු නොලැබීම අර්ථභාරී විය. එලිය හා ප්‍රසිද්ධිය  වෙනත් දෙයකට යොමු කරන ලද අතර කොමින්ටර්නයට ඉතුරු වූයේ අතිරේක වැඩ කටයුතු පමනකි. සත්වන සම්මේලනය "දියකර හැරීමේ සමුලුවය යි ඉතිහාසගත වනු ඇත." යි දෙන ලද ට්‍රොට්ස්කිගේ තීන්දුව අසාධාරන එකක් නොවන බව පෙනී ගියේ ය. සත්වන සමුලුව 1943 සමාප්තියට (කොමියුනිස්ට් ජාත්‍යන්තරය නිල වයෙන් ම විසුරුවා ලීමට මග පෙන්වීය." *The Twilight of the Comintern* කොමින්ටර්නයේ මල හිරු (1930-1935, නිව් යෝර්ක් 1982) 42 පිට.

[89]. තැචර්, 204 පිට.

[90]. කොමින්ටර්න් ඇන්ඩ් ද ජීපීයූ නමැති ලිපිය, ලියොන් ට්‍රොට්ස්කිගේ ස්ටැලින්ස් ගැන්ග්ස්ටර්ස් නම් 1977 ලන්ඩන් නිව් පාර්ක් පබ්ලිෂර්ස් විසින් පලකෙරුනු වෙලුමේ ඇත. ට්‍රොට්ස්කිගේ කොයොවාකාන් නිවසේ (1939-40) දක්වා ආරක්ෂක බලකායේ කපිතාන් ලෙස කටයුතු කල අභාවප්‍රාප්ත හැරල්ඩ් රොබින්ස් ට්‍රොට්ස්කි තමා විසින් ජීපීයූවේ වැඩකටයුතු පිලිබඳව සාකච්ඡා කරමින් සිටි ලිපි මාලාවට මෙම නම යෝජනා කල බව ප්‍රකාශකයන්ට දැනුම් දුනි.

[91]. තැචර්, 206 පිට.

[92].*Writings of Leon Trotsky 1933-34* (නිව් යොර්ක්, 1975), 259 පිට

[93]. තැචර්, 234 පිට.

[94]. තැචර් සඳහන් කරන ලිපිය නම්, "1941 ජුනියේ දී ස්ටැලින්ඃ සින්තියා රොබට්ස් ගැන අටුවාවක්" ස්ටීවන් ජේ. මේන්, ඉයරොප් - ඒසියා ස්ටඩීස්, වෙලුම 81. නොවැම්බර් 5, (1996 ජුලි) පිටු 837-39. මෙම ලිපිය "යුද්ධය සඳහා සැලසුම් කිරීම, රතු හමුදාව සහ 1941 ව්‍යසනය" ඉයරෝප් ඒසියා අධ්‍යයන 47 වෙලුම නො.8 (1995 දෙසැම්බර්) 1293-1326 පිටු.

[95].දැඩි සේ විවාදිත ඓතිහාසික ප්‍රශ්නයක් විසඳාලන ලද්දකැයි ප්‍රකාශයට පත් කිරීම තැචර්ගේ ප්‍රියතම වාචික උගුල්වලින් එකකි. තමාගේ මතයට පක්ෂපාතී ලිපියක් සොයාගන්නා ඔහු එය විශ්වසනීය යයි ප්‍රකාශකරයි. එහෙත් බොහෝ විශේෂඥයෝ ඒත්තු ගෙන නැත්තාහ. උදාහරනයක් හැටියට 1941 ව්‍යසනයට ස්ටැලින්ගේ වගකීම ගැන ඩේවිඩ් ඊ. මර්ෆි මෙසේ ලියයිඃ "යුද වර්ෂවල සිදු වූ භයංකර විනාශයනට විශේෂයෙන්ම යුද්ධයේ ප්‍රථම ඛේදජනක මාසවල, ස්ටැලින්ගේ පෞද්ගලික වගකීම, අඩුකර තැකිය හැක්කේ හෝ නැතැයි කිය හැක්කේ හෝ නොවේ." [ *What Stalin Knew: The Enigma of Barbarossa*, ස්ටැලින් දැන සිටියේ කුමක් දඃ බාබරෝසාවේ (හිට්ලර්ගේ රුසියා ආක්‍රමනයේ ගැටලුව)] (නිව් හෙවන් ඇන්ඩ් ලන්ඩන්ඃ 2005), 247 පි.

[96]. "යුදෙව්-විරෝධී ක්‍රම" (Anti-Semitic Devices,) ජනවාරි 30 [*Writings of Leon Trotsky 1936-37*, ට්‍රොට්ස්කි ලිපි 1936-37; (නිව් යෝර්ක්,1978), 177 පිට.

[97]. ට්‍රොට්ස්කිගේ යුදෙව් උපතේ සංස්කෘතික, මනෝවිද්‍යාත්මක සහ දේශපාලන ගම්‍යයන් ගවේෂනය කිරීම ඔහුගේ ජීවන චරිතය ලියන්නෙකු විසින් නොකටයුත්තක් නොවේ. කලින් සමහර ජීවන චරිත රචකයන්, එතරම් සාර්ථකව නොවූව ද එසේ කිරීමට උත්සාහ කර තිබේ. එහෙත් තැචර් මෙම තේමාව ගැන විශේෂ උනන්දුවක් නොදක්වයි; මේ නිසා ම "බ්‍රොන්ස්ටයින්ලා" පිලිබඳව ඔහු කරන අජුව හා කාරනා වසයෙන් අසත්‍ය සමර්පනයන් වඩාලාත් ම කැත හා සැක කටයුතු වෙයි.

[98]. තැචර්, 197 පිට.

[99]. තැචර්, එම. ( ඉටැලික් අකුරු)

[100]. ජෝන් ඩේවි එකොලොස් වන වෙලුම; 1935-37 මුද්‍රනය ජෝ ඈන් බොයිඩ්ස්ටන් (කාර්බන්ඩේල්ඃ දකුනු ඉලිනොයි යුනිවර්සිටි ප්‍රෙස්, 1991), 323පිට.

[101]. කොමිසමේ සංක්ෂිප්ත සොයාගැනීම් නිකුත් කිරීමෙන් පසුව ජෝන් ඩේවි මෙසේ ප්‍රකාශ කලේ යඃ "තුච්ඡ මෙන් ම කෲර ද වූ සමස්ත මොස්කව් නඩු පටිපාටිකරයේ අත්‍යන්ත අපකීර්තිමත් ස්වභාවය ගැන කොමිෂන් සභාවේ සාමාජිකයන් එකෙකු වත් නොහැර සන්ත්‍රස්ත වූවෝ ය." (එම 324 පිටුව)

[102]. නවකතාකරු සර් වෝල්ටර් ස්කොට් එය "බාසිටඩ් ව'ඩික්ට්" (අවජාතක තීන්දුවක් යයි සුප්‍රසිද්ධ ලෙස හෙලා දැක්කේ ය.

[103]. තැචර්, 224 පිටුව.

[104]. දර්ශනවාදයේ ඉතිහාසය පිලිබඳ හෙගල්ගේ දේශනයෝ. පරිවර්තනය, ඊ.එස්. හැල්ඩේන් සහ ෆ්‍රැන්සිස් එච්. සිම්ප්සන් (ලන්ඩන් සහ නිව් යෝක්, 1974) පලමුවන වෙලුම, 12 පිටුව.

[105]. තැචර්, 215 පිටුව. (අවධාරනය ඇඳිනි)

[106]. අදාල ඡේදයක් තුල ට්‍රොට්ස්කි ඇත්තට ම ලියා තුබූයේ පහත සඳහන් දෙයයිඃ "එතකුදු නොව ප්‍රන්සයන් සමාජ විප්ලවය අරඹනු ඇතැයි ද, ජර්මානුන් එය ඉදිරියට ගෙන යනු ඇතැයි ද ඉංග්‍රීසින් එය සමාප්ත කරනු ඇතැයි ද මාක්ස් අපේක්ෂා කලේ ය. රුසියානුවන් සම්බන්ධයෙන් ගතහොත් මාක්ස් කලේ ඔවුන් ඈත පසුකඩෙහි තැබීම ය. එහෙත් මෙම සංකල්ප පටිපාටිය සිද්ධීන් විසින් පෙරලා දමනු ලැබිනි. මාක්ස්ගේ සර්වත්‍රික ඓතිහාසික සංකල්පය පර්යායේ දෙන ලද අවධියක සෝවියට් සංගමය පිලිබඳ සුවිශේෂ සංසිද්ධියට යමෙකු විසින් යාන්ත්‍රිකව යොදනු ලැබේ නම් හෙතෙම ඒහාම එක්වරම ගොඩ ඒගත නොහැකි පරස්පර විරෝධයන්ගේ පැටලෙනු ඇත. (රෙවලූෂන් බිට්‍රේඩ්, (ඩිට්‍රොයිට් 1991) පිටු 40-41.

[108]. මාක්ස් සසුලිච්ට ලියූ ලියුම විශේෂ අරථභාරයක් ගත්තේ ඉතා බෙහෙවින් වෙනස් සන්දර්භයක් ඇතුලත ය. ක්‍රෙම්ලිනය, විශාල ගොවි ජනගහනයක් වාසය කල අප්‍රිකාවේ රටවල 'ධනේෂ්වර නොවන මාවතක්' හරහා කෙලින්ම සමාජවාදයට ගමන්කරන ඇතැයි කියා පෑවේය.ට්‍රොට්ස්කි 1922 නොවැම්බර් 14 දින කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ සිව් වන සම්මේලනයේ දී ට්‍රොට්ස්කි විසින් කරන ලද දේශනය ද නොතකා හැර තිබේ. ගොවි සාමූහිකය මත පදනම් ව සමාජවාදයට ප්‍රතිවර්තනය වී ගැනීම පිලිබඳ මාක්ස්ගේ සමපේක්ෂනයන් ට්‍රොට්ස්කි මෙහි දී සලකා බැලී ය. ඔහු මෙසේ කීයඃ "1883දී රුසියානු ජනතාවාදයේ (නරොද්නික්වාදයේ) න්‍යායඥයන්ගෙන් එක් අයෙකු මෙසේ ලිවීයඃ

"ඉතිහාසය විසින් රුසියානු ඔබ්ස්චිනාව (සාමූහික ගැමි කෘෂිකර්මය) අහෝසි කර දැමීමට පෙර යුරෝපීය කම්කරු පන්තිය බලය ගත හොත් එම තතු තුල මෙම ඔබ්ස්චිනාව පවා රුසියාවේ කොමියුනිස්ට් වර්ධනය උදෙසා ආරම්භක ලක්ෂ්‍යයක් විය හැකි ය. මෙහිලා මාක්ස් මුලුමනින් ම නිවැරදි විය." [එන්ර්පී ඇන්ඩ් වර්ල්ඩ් රෙවලූෂන් - ෆස්ට් ෆයිව්යර්ස් ඔෆ් ද කොමියුනිස්ට් ඉන්ටර්නැෂනල්; නව ආර්ථික ප්‍රතිපත්තිය සහ ලෝක විප්ලවය, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ප්‍රථම පස් වසර , දෙවන වෙලුම. (ලන්ඩන්, 1974) 230 පි.

][109]. "ස්ටැලින් හා ස්ටැලින්වාදයඃ සමාලෝචක ලිපියක්" ඉයරොප් ඒෂියා ස්ටඩීස් (56 වෙලුම, අංක 6, 2004 සැප්තැම්බර්) 918 පිට.

[110]. ඇලෙක්සැන්ඩර්, 32පි.

[111]. ඊ.එච්. කාර්ගේ "වට් ඉස් හිස්ට්රි" ඉතිහාසය කුමක් ද?, 27 පි.[1]ද

© www.wsws.org